# සප්ත කන්‍යා කඳු වැටිය, Seven Virgin Hills, (අන්ජීමලේ)

**ගමනේ අරමුණ:** 1974 වසරේ සප්තකන්‍යා කඳු ආශ්‍රිතව සිදු වූ ගුවන් අනතුර පිලිබඳ තොරතුරු අධ්‍යයනය, දුෂ්කර කඳු තරණය හා වනාන්තරයේ රාත්‍රිය ගත කිරීම, ත්‍රාසය පිරුණු අභියෝග වලට මුහුණ දී අත්දැකීම් වර්ධනය කර ගැනීම.

**සංචාරය කල දිනය :** 2016 පෙබරවාරි 05, 06, 07 දිනයන්

**සහභාගීවූවන් ගණන:** 5 යි (නිශාන් කුළසිංහ, මුදිත රූබසිංහ, ලසිත රත්නායක, සංජය ලක්මාල් සහ මග පෙන්වන්නා උපුල්)

**ගමන් කල ආකාරය:** පුද්ගලික මෝටර් රථයෙන්, පොදු ප්‍රවාහන බස් රථ, ත්‍රිරෝද රථ මගින් සහ පා ගමනින්

**විශේෂ ස්තුතිය:** මුදිත රූබසිංහ සහ එම මහත්මිය (සම්පූර්ණ ගමන සැලසුම් කිරීම, සිය නිවසේ නවාතැන් පහසුකම්, ආහාර පාන සැපයීම)

**ගමනේ ස්වභාවය:** ඉතා දුෂ්කර ගමනකි. අප තෝරා ගත් මග ඔස්සේ කන්ද මුදුනට යාමට පැහැදිලි අඩි පාරක් නොමැති වීම නිසා අතරමං වීමට ඉඩ ඇත. පළපුරුදු මග පෙන්වන්නකු අත්‍යාවශ්‍ය වේ. කන්දේ නැග්ම හා බාධක ආදිය නිසා ගමන අපහසු හා ඉතා අනතුරු දායකයි. ඔබ ශාරීරිකව නිරෝගීමත්ව සිටීම අනිවාර්යයි. වනාන්තරයේ ජලය නොමැති නිසා ගෙන යන ජලය කලමනාකරණය කර ගත හැකි අයකු විය යුතුය. එක් අයෙකු තම පරිභෝජනය සඳහා ජලය ලීටර් 2.5කට වඩා වැඩි ප්‍රමාණයක් රැගෙන යා යුතුය. වන සතුන්ගේ ප්‍රහාරයට පහසුවෙන් ලක් විය හැක. ගමනට සහභාගී වන්නන් ඕනෑම හදිසි අභියෝගයකට මුහුණ දිය හැකි ශාරීරික හා මානසික ශක්තියකින් යුතු අය විය යුතුය.

**ඇතුල්වීම:** විශේෂ අවසරයක් අවශ්‍ය නොවේ. නමුත් අදාල පොලිස් ස්ථානය දැනුවත් කිරීම සුදුසුය.

**ඡායාරූප :** නිශාන් කුළසිංහ

**මෙම වාර්තාව සැකසීම :** නිශාන් කුළසිංහ විසිනි

**ගමන් මාර්ගය:** කොට්ටාව > අවිස්සාවේල්ල > කිතුල්ගල > දියගල හංදිය > නොර්ටෝන් බ්‍රිජ් > කිරිවන්එලිය > කොත්තැල්ලෙන > සප්තකන්‍යා කඳු > ආපසු පැමිණීම එම මාර්ගය ඔස්සේම

(GPS ගමන් මාර්ගය (kml file), ඡායාරූප හා වීඩියෝ වැඩසටහන, මෙම වාර්තාව අවසානයේ දක්වා ඇති යොමු වලින් ලබා ගන්න)

www.LakViskam.org




www.LakViskam.org

ගමන් මාර්ගය

## පරිසරය පිළිබඳව

මෙම ප්‍රදේශය කඳුකර, ශීත-උණුසුම් දේශගුණය සහිත ඝන වනාන්තර ප්‍රදේශයකි. මීදුමෙන්, වලාකුළෙන් වැසී යන තද සුළං සහිතයි. කූඩැල්ලන් බහුලව දක්නට ඇති නිසා පැඟිරි තෙල් වැනි කූඩැලි විකර්ශකයක් භාවිතා කරන්න. වනාන්තරය තුල සර්පයින්, දිවියා, අලියා, වල් ඌරා, මී මැස්සා ආදී අනතුරුදායක සතුන් ගැවසිය හැක. අඩිපාර හා පොලොවේ ඇතැම් ස්ථාන ලිස්සන හා එරෙන සුළුය. ඇතැම් ස්ථාන වලදී ආරක්ෂා කාරී බව සඳහා කඹ භාවිතා කරන්නේ නම් සුදුසුය. සතුන් ගැවසෙන නිසා ආරක්ෂාව පිණිස රතික්ඥා, විදුලි පන්දම් ගෙන යා යුතුය. ජල මාර්ග නොමැති නිසා ශාරීරික අවශ්‍යතා සඳහා "ටොයිලට් පේපර්" වැනි දෙයක් රැගෙන යන්න. ජංගම දුරකථන සංඥා නොලැබේ, ලැබුනත් දුර්වල මට්ටමේ පවතී. මේ සියලු පරිසර තත්වවලට පෙර සූදානමක් ඇතිව ඇඳුම්, උපකරණ හා බෙහෙත් ආදිය රැගෙන එහි යන්නේ නම් මැනවි.

## ඉතා වැදත් කාරුණික ඉල්ලීමයි

ඔබ හුදු විනෝදය සඳහා පමණක් එහි යන්නේ නම් මෙම පරිසර පද්ධතිය ඔබ ඇතුළු සියලු ජීවී ප්‍රජාවගේ උරුමයක් නිසා එය ආරක්ෂා කර ගතයුතු බවට නිරතුරු සිහිතබා ගන්න. වෙනත් කටයුත්තක් සඳහා එහි ගියද පරිසරය ආරක්ෂා වන අයුරින් කටයුතු කරන්න. විශේෂයෙන් ගිනි මැල දැල්වීමේදී වනාන්තරයට ගිනි නොඇවිලෙන ලෙස එය සිදු කරන්න. ගිනිමැල නිසි ලෙස නිවා දමා අළු පවා ඉවත් කරන්න. සිගරට් භාවිතා නොකරන්න. සිගරට් කොට වැටීමෙන් වියලි කොල, බට පඳුරු පහසුවෙන් ගිනිගනී. පැළැටි, ශාඛ වලට හා සත්වයින්ට හානි නොකරන්න. ප්ලාස්ටික් ඇතුළු සියලු අපද්‍රව්‍ය ප්‍රදේශයට ගෙන යාම සීමා කර ගන්න. ඒවා එම ප්‍රදේශයේ බැහැර නොකර ආපසු ගෙනවිත් නිසි ස්ථානයකදී පමණක් බැහැර කරන්න. ඔබ මත්පැන් පානය කර මෙම ප්‍රදේශවල සංචාරය කිරීමෙන් වලකින්න. එය ඔබගේත් පරිසරයේත් එහි වෙසෙන සමස්ථ ජීවී ප්‍රජාවගේත් යහපතට ඉවහල් වේ. මේ පරිසර

පද්ධතිය සියලු ජීවී ප්‍රජාවගේය. එම නිසාවෙන් එම පරසරය සුරකින්න. අපෙන් පසුවට එන ජීවී ප්‍රජාවටත් එය ආරක්ෂාකර තබන්න. මෙය 'ලක් විස්කම්' ඔබෙන් කෙරෙන ඉතා බැගෑපත් ඉල්ලීමයි!

**සප්තකන්‍යා සම්බන්ධ තොරතුරු හා ගුවන් යානා අනතුර**

මස්කෙළිය ලක්ෂපාන දිය ඇල්ල ආසන්නයේ තෙබර්ටන් වතු යායට ඉහලින් වූ වනාන්තරයෙන් පැන නගින සප්ත කන්‍යා කඳු පංතිය (සෙවන් වර්ජින්ස් හිල්ස්) යනු කන්‍යාවන් සත් දෙනෙකු සැතපී සිටින ආකාරයට පෙනෙන නිසා පට බැඳුණු නමක් බවට කියවේ. එසේම කාන්තාවක් සිය දිගු වරලස කඩා දමා සැතපී සිටින ආකාරයක් දිස් වෙන නිසා එම නම භාවිතා වන බවට තවත් අදහසකි. සප්ත කන්‍යා නොහොත් කඳු හතක් ගැන සිංහලෙන් කිය වුනත් දමිල බසින් හඳුන්වන අන්ජි මලෙයි යන නාමයෙන් කිය වෙන්නේ "කඳු පහ" යන අර්ථයයි. සැබෑවටම මෙම කන්දේ කඳු මුදුන් හතක් ඇති මුත් බොහෝවිට කන්දට උතුරු. ඊසාන නැගෙනහිර දෙසින් දර්ශනය වන්නේ කඳු පහකි. ඉතිරි කඳු දෙක මදක් ඈතින් වෙනම පිහිටීමක පිහිටා ඇති නිසා එසේ දර්ශනය වේ. එහි උඩලක්ෂපානගල නම් උස්ම කඳු මුදුන දළවශයෙන් අඩි 5150ක් පමණ වේ. කඳු මුදුන් ඔස්සේ කඳු වැටියේ දිග ගතහොත් කිලෝමීටර් 5 කට ආසන්නය (ඇවිදීමට ඇති දුර මීට වඩා වැඩිය). ශ්‍රී පාද අඩවියේ ශ්‍රීපාද කන්දට ආසන්නයෙන් සප්තකන්‍යාවියන් නැගී සිටී. ශ්‍රීපාද කඳු මුදුනේ සිට හරියටම උතුරු දෙසින් කි.මී. 9ක් ඈතින් මෙම කඳු පෙළ දැකිය හැක. දිස්ත්‍රික්ක කිහිපයකට අයත් වන සේ පිහිටා ඇති කඳුවැටියේ නැගෙනහිර බෑවුම නුවරඑළිය දිස්ත්‍රික්කයටත් බටහිර බෑවුම කෑගල්ල දිස්ත්‍රික්කයටත් විහිදී යයි.

අද්භූත පෙනුමක් සහිත මෙම කඳු වැටියේ නම කියූ පමණින් බොහෝ දෙනාගේ සිහියට නැගෙන්නේ 1974 වර්ෂයේ දෙසැම්බර් මස 4 වන දින ලංකාවේ සිදු වූ බිහිසුණුම ගුවන්යානා අනතුරයි. ගුවන් යානය ඉන්දුනීසියාවේ සුරබයා සිට සවුදි අරාබියේ ජෙඩා ගුවන් තොටුපල දක්වා යන අතරමැදදී ඉන්ධන ලබා ගැනීම පිණිස කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට ගොඩබෑමට නියමිත විය. ඉන්දුනීසියාවේ ගරුඩා ගුවන් සේවය වෙනුවෙන් ඩෙන්මාර්ක් මාර්ටින් එයාර් ගුවන් සමාගම සේවයේ යෙදවූ DC-8-55CF (ෆ්ලයිට් 138) ගුවන් යානයේ දුර දක්වන උපකරණයේ දෝෂ නිසා එය කඳු වැටියේ හැපී විනාශ විය. මක්කම වන්දනාවට යන ඉන්දුනීසියානු ගුවන් මගීන් 182ක පිරිසක් හා කාර්ය මණ්ඩලයේ 9 දෙනෙකු ඇතුළුව 191 ක් වූ මිනිස් ජීවිත ප්‍රමාණයක් සිරිපා අඩවියේදී රාත්‍රී 10.10 ට සප්ත කන්‍යාවේ හැපී ලොවට අහිමි විය. වම් පස සිට බලන විට පස් වන කන්දේ ඉහල කොටසේ හැපී විනාශ වූ යානයේ වම් පස තටුව ගලේ ඇදී ගොස් ඇඳුනු ඉර පවා දැන් වනාන්තරය නිසා වැසී ගොසිනි. ගුවන් යානය ගැටීමෙන් කැලයේ අක්කර ගණනාවක්ද ගිනිගෙන විනාශ වී ඇත. යානයේ කළු පෙට්ටිය හමු නොවුයෙන් යුධ හමුදා කණ්ඩායමක් යොදවා ඇදිරිනීතිය පනවා ගැමියන් කන්දෙන් ඉවත් කර එය සෙවීම කරන ලදී. සුන්බුන් අතර තිබී ලුතිනන් විපුල් බොතේජු ඇතුළු කණ්ඩායම විසින් කළු පෙට්ටිය සොයා ගත්තත් එය කොටස් වලට කැඩී තිබුණු බවට සඳහන් වේ. මේ නිසා එයින් තොරතුරු ලබා ගැනීමට නොහැකි වී ඇත. එකල මෙම අනතුර දැක බලා ගැනීම පිණිස ලක්ෂ සංඛ්‍යාත ජන ගඟක් පැමිණ ඇති අතර "ගුවන් යානා අනතුර වූ ස්ථානය නැරඹීමට" යනුවෙන් නාමපුවරු සහිත ලංගම බස් රථ පවා ධාවනය කරවා ඇති බවට පැවසේ. අනතුර සිදුවූ අවස්ථාවේ ප්‍රධාන ගුවන් නියමුවා වුයේ ගුවන් පැය 26770ක පළපුරුද්ද සහිත නෙදර්ලන්ත ජාතික හෙන්ද්‍රික් ලැමී ය. ඔහු ශ්‍රී ලංකාවට පියාසර කර ඇතත් මෙම මාර්ගය ඔස්සේ ලංකාවට ඉහලින් ගුවන් යානයක් පදවන මුල් අවස්ථාව බවට පැවසේ. එම ගමනට නෙදර්ලන්ත ජාතික ජෝහැන්නන්ස් ගිජ්බර්ටස් විජ්නන්ඩ්ස් කාර්යභාර ඉංජිනේරු ලෙස සහභාගී වී ඇත. එකල ශ්‍රී ලංකාවේ රාඩාර් පද්ධතියක් නොවූ නිසා ගුවන් යානය මගින් ලබා දෙන උස ආදී තොරතුරු මත පදනම්ව පාලක මැදිරියෙන් යානයට උපදෙස් ලබා දේ. රත්මලාන ප්‍රාදේශීය ගුවන් පාලක මධ්‍යස්ථානයට යානය ලබා දුන් තොරතුරු අනුව අඩි 35000 සිට අඩි 6000 ක් දක්වා යානය පහලට ගෙන ඒමට අවසර දී ඇත. ඉන්පසු සම්බන්ධතාවය කටුනායක පාලක මධ්‍යස්ථානයේ මහේෂ් ද සිල්වා මහතා ප්‍රමුඛ ගුවන් යානා පාලන කුළුණ විසින් භාරගෙන ඇත. යානය ගුවන්තොටුපලේ සිට නාවික සැතපුම් 14ක් තරම් ආසන්නයෙන් සිටින බවට දැන්වූ පසු පාලක මැදිරියෙන් දුන් උපදෙස් අනුව අඩි 2000ක් දක්වා පහතට ගෙන ගොඩබෑමට සූදානම් වී ඇත. එය එසේ වී ඇත්තේ යානයේ දුර ගණනය කරන උපකරණ වල දෝෂයක් නිසා බවට හෙළි වී ඇත. මීට ප්‍රථම ගුවන් නියමුවන් දෙදෙනෙකුද එම යානයේ දෝෂය වාර්තා කර ඇති බවට කරුණු හෙළි වී ඇත. එදින යානයේ ඇති රාඩාර් පද්ධතියද නිසි පරිදි ක්‍රියාත්මක වී නොමැත. එසේම ලක්ෂපාන බලාගාරයේ දීප්තිමත් විදුලි බුබුළු හා බලාගාරය දක්වා ජලය ගෙන යන විශාල නල පද්ධතියේ ආරක්ෂාවට සවි කර තිබූ දීප්තිමත් විදුලි බුබුළු දුටු නියමුවන් ඒ ගුවන්තොටුපල යයි වරදවා වටහාගෙන ඇති බවටද පැවසේ.

මියගිය සියලු දෙනාගේ සිරුරු කොටස් සමූහ ලෙස මිහිදන් කරන ලද අතර ඉන්දුනීසියානුවන් විසින් මියගිය ගිය අය සිහිවීමට කන්ද පාමුල ස්මාරකයක් ඉදි කර ඇත. එක් ගුවන් සේවිකාවකගේ සිරුර ඇගේ පෙම්වතා විසින් මව්

www.LakViskam.org

රටට ගෙන ගිය බවටද පැවසේ. සිරිපාද කන්ද උඩින් පැමිණි නිසා මෙම අනතුර සිදු වූවා යයි ජනතාව තුල ඇති මතයේ සත්‍යතාවයක් නොමැති අතර ගුවන් මාර්ගය සිරිපා කන්ද දෙසට කිසිසේත් වැටී නොතිබිණි. මෙම කන්ද ආශ්‍රිතව විවිධ අද්භූත සිදු වීම් පිළිබඳව කථා ඇති අතර ජාතික පුවත්පත් වල පවා අදාල රචකයින් ඒවා පල කර ඇත. මීට වසර ගණනාවකට පෙර සප්තකන්‍යාවේ සැරි සැරූ වන ජීවී නිලධාරීන් පිරිසකට මුහුණ දෙන්නට සිදුවූ සිදු වීම ඉන් ප්‍රධාන වේ. මිය ගිය ගුවන් සේවිකාවකගේ භූත ආත්මය මෙම කැලයේ සැරිසරමින් සිටි අයුරුත් ඇයට වශී වූ පුද්ගලයෙක් මරණයට පත් වන අයුරුත් පසුව කලකදී ස්වාමීන්වහන්සේ නමක් සමග කන්ද තරණය කර ඇය පැවසූ පරිදි ඇටකටු මිහිදන් කර පින් පමුණුවා ඇයව එම ස්ථානයෙන් නිදහස් කල අයුරු එම සත්‍යයයි සඳහන් කරන කතාවේ සඳහන් වේ. කෙසේ වෙතත් එම ආත්මය රාත්‍රියේදී නිරුවතින් දිය නෑවේයැයි පැවසෙන ජල පහරක් අපට කැලය තුලදී නම් හමු නොවීය. කන්ද පාමුල ඇති අත්හැර දැමූ තේ කම්හලේද අද්භූත සිදු වීම් සිදුවන බවට ගැමියන් කිහිප දෙනෙක් පවසන ලදී. එහිදී කාන්තාවක් ගෙල වැල ලා මිය ගිය බවට කතාවක්ද ඇත.

මෙම අනතුර පිළිබඳව ගෙතුණු ප්‍රදේශයේ කුඩා ළමුන් භාවිතා කරන සරල කවි කොටසක් අපට දැන ගන්නට ලැබුණි.

ඕලන්ද රටෙන් ප්ලේන් එකක් නොර්ටන් ආවා - අන්ජි මලේ කන්දේ හැපී එය පොඩි වුවා…

**ගමන් විස්තරය**

සප්ත කන්‍යා කඳු තරණය කිරීමට අදහසක් මා සිතේ බොහෝ කලක සිට පැලපදියම් වී තිබුනත් ඊට අවශ්‍ය තොරතුරු හා පහසුකම් සපයා ගැනීමේ අපහසුව නිසා එය ඉටු කර ගැනීම ගැටළුවක්ව තිබිණි. මේ අතර අප කාර්යාලයේ සේවය කරන සහෝදර මුදිත විසින් මෙම කන්ද නැගීමට යෝජනා කරන ලද්දේ මීට වසර කිහිපයකට පෙර සිටය. ඔහුගේ භාර්යාවගේ ගම කිරිවන්එලිය වූ නිසා එය මෙම ගමනට මහත් පිටුවහලක් විය. ජනවාරි පෙබරවාරි මාස වල ඉතා හොඳ කාලගුණ තත්වයක් පැවතුනු නිසා මුදිත විසින් නැවත එම අදහස ඉදිරිපත් කරන ලදී. එයට එකඟ වූ මා මෙම ගමනට 2016 පෙබරවාරි 5,6,7 දින යොදා ගතිමි. මුලදී ගමනට සහභාගී වීම ස්ථිර කල 4 දෙනෙක් අවසාන දින කිහිපයේ නොවැලැක්විය හැකි හේතූන් නිසා "හැලී" ගියහ. ගමනට අවශ්‍ය බඩු වල බර බෙදාගෙන රැගෙන යාමට කල සැලසුම් මේ හේතුවෙන් ගඟට කැපූ ඉනි මෙන් විය. කෙසේ හෝ මේ ගමන යා යුතු යයි දැඩි ස්ථාවරයේ සිටි මා පෙර සැලසුම හදිසියේ වෙනස් කර කොට්ටාවේ සිට මාගේ කාර් රථයෙන් ලසිත හා සංජය සමග ප.ව. 6.30ට මස්කෙළිය බලා පිටත් වුනෙමු. මුදිත කලින් කිරිවන්එලිය නිවසට ගොස් සිටි අතර අප අතර මගදී ගමනට අවශ්‍ය කෑම බඩු ආදිය මිලදී ගත්තෙමු. මස්කෙළිය ආසන්නයේදී ඉතා රෑ බෝ වී තිබූ බැවින් දැඩි නිදිමත බවකින් යුතුව වාහනය ධාවනය කලේ අනතුරු කීහිපයකින් නුලෙන් බේරෙමිනි. රාත්‍රී 12 ආසන්න වන විට මුදිතගේ කිරිවන්එලිය නිවසට පැමිණියෙමු.

නිවසට ගිය සැනින් පසුදින ගමනට අවශ්‍ය බඩු සූදානම් කළෙමු. බඩු අතර, කූඩාරම්, කඹ, පිහි, රතික්ඤා, භූමිතෙල් ලිප සහ භූමිතෙල්, ටින් කල කෑම වර්ග, කුඩැලි විකර්ෂක, ජීවනී, ප්‍රථමාධාර, විදුලි පන්දම්, අතිරේක ඇඳුම්, වර්ෂාවෙන් ආරක්ෂා වීමට අවැසි දේ විය. අප ගෙන ආ විශාල කූඩාරම දිග හැර බැලූ විට බර නිසා එය රැගෙන යාම කල නොහැක්කක් බවට වැටහිණි. කණ්ඩායම කුඩා නිසා හැකි තාක් බඩු අඩු කල අප එක් අයකු ගෙන යා යුතු ජලය ප්‍රමාණයද අඩු කරන ලදී (ජලය වැඩි පුර ගෙනයාම මෙම ගමනට අත්‍යවශ්‍ය හා ප්‍රධානතම දෙයකි). තද සීතල බවක් තිබූ බැවින් ඉක්මනින් නින්දට ගොස් පසුදින උදේ 5ට පමණ අවදි වූයෙමු.

www.Lakviskam.org



නිවසේ සඳළුතලයට සප්තකන්‍යාව පෙනෙන අයුරු



කොත්තැල්ලෙන කඩමණ්ඩිය

එම නිවසේ සඳළු තලයට ගිය විට සප්ත කන්‍යාව ඉතා හොඳින් හා අලංකාර ලෙස දර්ශණය විය. මුදිතගේ භාර්යාව හා ඇගේ නැන්දා කෙනෙකු විසින් අපගේ උදේ හා දවල් ආහාරය සකස් කරන දෙන ලදී. උදෑසනින්ම උදේ ආහාරය ලබාගෙන ගමනට පිටත් වූයෙමු. මුදිත විසින් කිරිවන්එළියේ සිට කොත්තැල්ලෙන ගම දක්වා යාමට ත්‍රි රෝද රථ සූදානම් කර තිබුණි. උදෑසන 8.30 ට කොත්තැල්ලෙන කඩ මංඩියට ලඟා වූ අපට මුදිත සූදානම් කරගත් අපේ මග පෙන්වන්නා උපුල් හමු විය. ඔහු හඟරාපිටිය ගමේ පදිංචි කරුවකු වන අතර යුධ හමුදාවේ විශේෂ බලකායේ සේවය කොට වසර කීපයකට පෙර සේවයෙන් ඉවත් වූ අයෙකි (ඔහුගේ දුරකතනය 0774831718). එතැන් සිට මහාමාර්ගය දිගේ ඉදිරියට ගමන් කල අප 5 දෙනා තේ වත්තක් මැදින් ගොස් ගුවන් යානයේ සිට මියගිය මගීන්ගේ නම් සඳහන් කර ඉන්දුනීසියානුවන් විසින් සකස් කර ඇති අනුස්මරණ ස්මාරකය නැරඹුවෙමු. ගුරුලෙක් සහිත එහි ඉහල කොටස කිසිවෙකු විසින් කඩා දමා ඇති බව මග පෙන්වන්නා පැවසීය. ආපසු මහාමාර්ගයට අවතීර්ණ වූ අප තවත් ඉදිරියට ගොස් තේ වත්තක ජල මාර්ගයක් අසලින් කන්ද නැගීම ආරම්භ කළෙමු. මෙය ඔබට හමුවන අවසන් ජල මූලාශ්‍රයයි.

www.LakViskam.org



අනුස්මරණ ස්මාරකය



ගිරා හොටක් වැනි "කොටුගල" පර්වතය

දකුණු පස සිට පලමු හා දෙවන කන්දේ අතර මැදින් ඉතා අපහසුවෙන් ඉහලට නැගීමට පටන් ගත්තෙමු. කූඩැල්ලන්ගෙන් බේරීමට මා පැඟිරි තෙල් භාවිතා කල අතර ගමන අවසන් වන තෙක්ම කිසිඳු කූඩැල්ලකුගේ සපා කෑමකට ලක් නොවී සිටීමට හැකි විය. අනෙක් සියළු දෙනා කූඩැලි ප්‍රහාර වලට ලක් විය. අප ගමන් කල මාර්ගයේ කිසිඳු අඩි පාරක් හෝ දක්නට නොවීය. බාධක රැසක් තුලින් ඒවා මැඩගෙන ඉහලට යා යුතුය. නැවත ආ මග සොයා ගැනීමට ගස් වල සුළු කැපුම් යෙදීමට සිදු විය. කොල රොඩු අතර විෂ ඝෝර සර්පයින්, ගෝනුස්සන් රැඳී සිටින බවට

සිහි තබා ගත යුතුය. කැලයේ විශාල වශයෙන් කූඩැල්ලන් ද සිටි. පස බුරුල් ස්වභාවයකින් යුතු නිසා තියුණු නැග්මන් සහිත ස්ථාන අනතුරුදායක වේ. විශාල ගල් ගැලවී පහලට එන නිසා ගමන ඉතාමත් අවදානම් වේ. කන්දේ කුරු අලි ගැවසෙන නිසා ප්‍රවේශම් විය යුතුයි. කන්දේ ඉහල කොටස පුරා කොළ පැහැති බට පඳුරු විශේෂ ඉතා විශාල වශයෙන් වැවී ඇත. ඉදිරියෙන් යන පුද්ගලයා නිසා බට ගස් ආපසු ගැස්සී ඇවිත් ඇස් වල වදින බැවින් ඉතා කල්පනාකාරී විය යුතුයි. විෂ කටු සහිත පඳුරු බොහෝ ස්ථාන වල ඇත. කෙසේ වෙතත් වනාන්තරය තුලින්ම යා යුතු නිසා අප මත හිරු එලිය පතිත වුයේ අඩු වශයෙනි. ගමන අතරවාරයේ සුපුරුදු ජීවනී පානය විජලනයෙන් වැලකීමට භාවිතා කළෙමු. උදේ 10.45ට පමණ අප බට කැලෑවේ ආරම්භක ස්ථානයට පැමිණි අතර එතැන් සිට නැග්ම තියුණු විය. පස බොහෝ සෙයින් බුරුල් නිසා කළු ගල් පහසුවෙන් ගැලවී පහලට පෙරලී එයි. එවැනි මාරක අවස්ථා කිහිපයකින් බේරීමට අප වාසනාවන්ත විය. ගල් ගැලවී එන නිසා ඉතා හෙමින් නැගීම සිදු විය. ඇතැම් ස්ථාන වලදී අප කඹ යොදා ගත් අතර එමගින් අවදානම මනා ලෙස කළමනාකරණය කර ගැනීමට හැකි විය.





දුෂ්කර නැග්මන් පසු කරමින්

www.Lakviskam.org

එක් තියුණු නැග්මකදී විශාල සර්පයකු කඹය යටින් ගොස් අප සගයින්ට දෂ්ඨ කිරීමට උත්සහා ගත්තේය. සර්පයාගේ නම් නොදනිතත් මගපෙන්වන්නා උපුල් පැවසුයේ එම වර්ගයේ සර්පයකු තමා හට දෂ්ඨ කර ඇති බවත් ඔහුගේ ශරීරය පන නැති වී බොහෝ කලක් පීඩා විඳි බවත්ය. සර්පයා පැය භාගයකට ආසන්න කාලයක් අප මාර්ගය හරස් කර දෂ්ට කිරීමට උත්සහා කල අතර ඌ මරා දැමීමට මතු වූ අදහසට තදින් විරුද්ධ වීමු. කෙසේ හෝ සර්පයා අවසානයේදී අප අත්හැර කන්ද උඩට ගිය නිසා කඹේ ආධාරයෙන් එම මාරකයද පැන ගත්තෙමු. අප ගමන් කල මාර්ගයේ බොහෝ තැන් වල ඉතා සුවදැති සුදු හා කහ පැහැති විශාල, වතු සුද්ද මල් වලට සමාන මල් වර්ගයක් ගස් වලින් බිම වැටී තිබෙනු දක්නට හැකි විය. ප.ව. 12.45 වන විට ගුවන් යානය වැදුණු කන්දේ අංශක 90 ට ඇති භයංකාර දල බෑවුම ගස් අතරින් දර්ශනය විය. තවත් විනාඩි කීපයකින් තියුණු නැග්ම ජයගෙන එළිමහන් ස්ථානයකට පිවිසුනෙමු. එතැන් සිට අඩි පාරක සලකුණු දක්නට විය. මගපෙන්වන්නා පැවසුවේ එය ඇලි 7 ප්‍රදේශයේ සිට පැමිණෙන අඩි පාරක් බවයි. ප.ව. 1.15 ට පමණ අප ගෙන ආ බත් පැකට් දහවල් ආහාරයට ගත්තෙමු. ජලය ඉතුරු කර ගත යුතු නිසා කෑමට පෙර අත් සේදීමක් පවා නොකළෙමු. කාලය මදි වේයයි දැනුනු බිය නිසා හැකි ඉක්මනින් නැවත ගමන් ආරම්භ කළෙමු. අතරමග සාමාන්‍ය ප්‍රමාණයේ ඇහිරිනු ගල් ලෙනක් දක්නට ලැබුණි. කන්දේ අනෙක් පසින් මතු වූ අපට විශාල එළිමහන් ගල් තලාවකට සිට අවට අසිරිය විඳිය හැකි විය. ඊට මදක් ඈතින් තෙතමනය සහිත තවත් ගල් තලාවක් හමු විය. උපුල් පැවසුයේ එම ගලෙන් ඉතා සෙමින් ජලය ගලා එන නිසා බෝතලයක් රඳවා තැබුවොත් ආපසු එන ගමනේදී එය පිරී පවතිනු ඇති බවයි. අප බෝතලයක් නොතබා නැවත බට කැලෑ තුලින් ගමන් කරන විට වල් ඌරා, දිවියා ගැවසෙන තැන් පැහැදිලිව දක්නට හැකි විය. කඳු මුදුන් මතින් ගොස් ගුවන් යානය හැපුණු ස්ථානයට ආසන්නතම කඳු මුදුනට ප.ව. 3.30 ට පමණ ළඟා වීමට හැකි විය.



සියුම් දිය සීරාවක් සහිත කළුගල



ගුවන් යානය හැපුණු ස්ථානය කෙලින් ඇති බුදු පිළිමය

ගුවන් යානය හැපුණු අවධියේදී ගමේ පන්සලේ හාමුදුරුවන් වහන්සේ නමක් විසින් කැලයේ තැම්පත් කලේ යැයි කියන පැරණි බුද්ධ ප්‍රතිමාව අදටත් දැක ගත හැක. එහි ආවරණයට අප ගෙන ගිය ඇලුමිනියම් තහඩුවක් සකස් කර වහලයක් මෙන් රැඳවූයෙමු. බට ගස් අතරින් බෑවුමේ උපරිමයට ගමන් කර යානය වැදුණු ඉසව්ව යාන්තමින් බලා ගැනීමට හැකි විය. ගස් වැවී ඇති නිසා එය දැක ගැනීම ඉතා අපහසුය. ක්‍රමයෙන් අඳුරු වැටෙන ස්වභාවය නිසා හැකි වේගයෙන් අප කඳු මුදුන් වල ඇවිද ගියෙමු. කටු පඳුරු හා රිංගා යා යුතු ස්ථාන නිසා ගමනේ වේගය මදක් අඩු විය. රාත්‍රිය ගත කිරීමට අප සිතා සිටි "කොටු ගල" පර්වතයට ළඟා වීමට කාලය මදි නිසා ඊට පෙර වූ කඳු මුදුනේ ඝන කැලෑවේ සමතලා ස්ථානයක රාත්‍රිය ගත කිරීමට තීරණය කළෙමු. එවිට වේලාව ප.ව. 6.15 පමණ වූ අතර අඳුර වේගයෙන් අපව ගිල ගනිමින් පැවතුනි. ලඟි ලඟියේ බිම සකස් කර කූඩාරම අටවා අනිකුත් දෑ සකස් කළෙමු. මා සහ උපුල් අවට කැලයේ සැරිසරා දිරා ගොස් බිම වැටී තිබූ දැව කොටන් කඳුවුරු භූමියට රැගෙන ආවෙමු. අප නැවතීමට තෝරා ගත් ස්ථානය වන සතුන් ගමන් කරන මාර්ගයක් බව අවබෝධ විය. එය වඩා අනතුරු දායක වුයෙන් උපුල් හා මා වහ වහා ගිනි මැලය දැල් වූයෙමු. සාමාජිකයින් ගණන අඩු නිසා අවම බඩු ප්‍රමාණයක් ගෙන ආ අපට එයින් සියල්ල කළමනාකරණය කර ගත යුතු විය. අප සතු වූ එකම කූඩාරම තුන් දෙනෙකුට සිටිය හැකි එකකි. කෙසේ හෝ අප සතර දෙනෙක් එය තුල සිටීමට කතා කර ගතිමු. උපුල් එළියේ රැය ගත කිරීමට ස්වේච්ඡාවෙන්ම තීරණය කර තිබුණි. කරුවලේ ගිනි මැල එළියෙන් හා විදුලි පන්දම් එළියෙන් කඳවුර අවට එළි පෙහෙළි කර කඹ පාවිච්චි කර රෙදි වැලක් ගැට ගැසුවෙමු. දාඩියෙන් පෙඟුනු ඇඳුම් එහි දමා සපත්තු ගස් උඩ එල්ලුවේ සර්ප බිය නිසාය. කූඩාරමට මදක් ඈතින් වටේටම භූමිතෙල් වත් කලේ සර්පයින්ගෙන් ආරක්ෂා වීම පිණිසය. දුරකථන සංඥා නොමැති වුවත් එක් වරම සංඥා ලැබෙන ස්වභාවයක් තිබූ අතර එසේ සංඥා ලැබෙන විට යාන්තම් නිවෙස් අමතා අප කැලෑවේ ආරක්ෂිතව සිටින බව දන්වන ලදී. කෑම පිළියෙළ කිරීමට අවශ්‍ය තරමට වතුර අප සතු නොවූ නිසා සීනි සම්බෝල, මාගරීන් සමග පාන් අනුභව කලෙමු. කූඩාරම ඇතුල රස්නය සහිත වුවත් එළිය සීතල විය. මීදුම අවට කැලෑව ගිලගෙන ඇති බව විදුලි පන්දම් එළියෙන් දැක ගැනීමට ලැබුණි. අප ගෙන ආ දර කොටන් එළි වන තුරු ගිනි මැලය දැල් වීමට ප්‍රමාණවත් නොවන බව පෙනිණි. අපගේ සගයින් මේ මහා ඝන වනයේ අන්ධකාරයේ දර සෙවීමට යාමට සූදානම් බවක් නොපෙනිණි. දර ගෙන ආවේ නැතිනම් සියලු දෙනාගේම ජීවිත අවදානමේ බව වටහා ගත් මා හා උපුල් රාත්‍රී 9 ට පමණ නැවත මහ කැලයට යාමට තීරණය කළෙමු. ආරක්ෂාව පිණිස රතිඤ්ඤා කීපයක් පත්තු කර විදුලි පන්දම් දෙකක් හා පිහි රැගෙන ඒ භයානක කැලයට රිංගුවෙමු. මේ සමන් දෙවියන්ගේ අඩවිය වූ බැවින් උන්වහන්සේ කෙරෙහි ඇති අප්‍රමාණ භක්තිය පෙරදැරි කරගෙන විශ්වාසයෙන් දර සොයා ඇවිද්දෙමි. මීදුම නිසා විදුලි පන්දම් එළියෙන් දුර පෙනුනේ නැත. රැහැයියන්ගේ කෑගැසිල්ල හැරුනු කොට වූ දැඩි නිහඬතාවය බිඳිමින් සිවුපා සතුන් එක් වරම කැලෑව බිඳගෙන යන හඬ ඇඟේ ලේ වතුර කර වීමට සමත් විය. දිරා ගිය දර කොටන් විශාල ප්‍රමාණයක් එක් රැස් කර කපා වාර කිහිපයකට සෑහෙන දුරක් ගෙවා කඳවුර දක්වා බිම දිගේ ඇදගෙන ආ යුතු විය. උපුල් ද සෑහෙන දර ප්‍රමාණයක් සොයා ගෙන තිබිණි. දර සොයාගෙන පැමිණෙන විට අපගේ සගයින් තිදෙනා කූඩාරමේ නින්දට යාමට ඇල වී සිටියහ. උපුල් එළියේ නිදා

www.lakviskam.org

ගන්නා අතර වරින් වර ගිනිමැලයට දර දැමීමට හා ආරක්ෂාව පිණිස මාරුවෙන් මාරුවට අවදි වී සිටීමට කතා කර ගත්තත් විනාඩි කිහිපයක් තුල අප සගයින් ගොරව ගොරවා නිදන්නට විය.



අඳුර වැටෙමින්



මහ වන මැද තනි වී

හදිසියේම කුඩා පොද වැස්සක් පතිත වන්නට වූ නිසා අපට සුළු බාධාවන් සිදු විය. කෙසේ හෝ කූඩාරමේ අවදියෙන් වාඩි වී සිටි මා වරින්වර ඉන් එලියට පැමිණ අවට වනාන්තරය විදුලි පන්දම් වලින් පිරික්සා බැලුවේ අප සතුන් ගමන් කරනා මාර්ගයේ සිටි බැවිනි. සියලු දෙනා නින්දට වැටී සිටි නිසා කැලි කපන අඳුරේ උන් ඒ රාත්‍රිය දැඩි ඉසිලිය නොහැකි නිහඬතාවයකින් යුක්ත විය. එය මාතුල යම් මුසල හැඟීමක් ජනිත කරවන්නටද විය. සප්ත කන්‍යා ආශ්‍රිත අද්භූත සිදුවීම් පිලිබඳ කියවා හා ගැමියන් පැවසූ කතා සිහිපත් වන්නට විය. එක්වරම සතෙකු මර ලතෝනි දෙන ශබ්ධයක් ඇසුනි. ටික වෙලාවකින් වල් ඌරන් වැනි සතුන් කොල අතරින් ශබ්ධ නගා දුවන ශබ්ධය කූඩාරමට ආසන්නයෙන්ම ඇසුනි. එවිට රාත්‍රී 12ත් පසු වී තිබූ අතර ඉන් පසු නැවත වනාන්තරය සුපුරුදු නිහඬතාවයේ ගිලුණි. වරින් වර එලියට ගොස් ගිනි මැලයට දර දැමූ මා හටත් නිදිමත තදින් දැනෙන්නට විය. බැරිම තැන ලසිතව අවදි කර මා නින්දට වැටුනෙමි. නැවත පාන්දර 3 ට පමණ ඇහැරෙන විට සියලු දෙනා නින්දේ සිටි අතර ගිනිමැලය නිවී තිබුණි. වහා එලියට ගොස් එය නැවත අවුළුවාලූ පසු උපුල් අවදි වී ගිනි මැලය බලා ගන්නට විය. මා නැවත නින්දට ගියෙමි. කූඩාරමේ සතර දෙනෙකු එකට සිරවී සිටි නිසා එහා මෙහා හැරෙන්නටවත් නොහැකි විය. විශාල ගල් කොන්දේ ඇනෙන නිසා කිසිදු සුවපහසු නින්දක් නොවීය. ඉතා අපහසුවෙන් වුවද නින්දට වැටුණු මා පාන්දර 5.30 ට අවදි වීමි. ශරීරකෘත්‍ය කිරීමට ජලය නැති නිසා "ටොයිලට් පේපර්" වලින් සෑහීමකට පත් විය යුතු විය. උදෑසනම මීළඟ කඳු යාම අපගේ අධිෂ්ඨානය විය. එහෙත් ඊට ඉදිරිපත් වුයේ මුදිතත්, මමත්, උපුලුත් පමණි. අනෙක් සගයන් තෙහෙට්ටුව නිසා කඳවුරේ නතර වී උදේ ආහාරය පිළියෙළ කිරීම කරන ලදී. වතුර කෑම හා එක් බෑගයක් පමණක් රැගෙන අප තිදෙනා ඉතාමත් දුෂ්කර මගක් ගෙවා කොටු ගලට නැග ගත්තෙමු. ඉදිරි පසින් බලන විට ගිරා හොටක් මෙන් දිස් වන එය කොත්තැල්ලෙන ගමේ සිට බලන විය දකුණු පස සිට පස් වන කන්දයි. එය තනිකරම ඉතා විශාල කළු ගල් පර්වතයකි. සෑම දෙසින්ම අවට පරිසරය ඉතා දර්ශණීය ලෙස පෙනෙන්නේ මෙම පර්වතයට පමණි. එය ඒතරම්ම සුන්දර, වචනයෙන් විස්තර කල නොහැකි දර්ශණ තලයකි. මීට වසර ගණනාවකට පෙර මෙයද ගස් වැල් වලින් වැසී පැවතුනත් එකල ගැමියන් එහි දැල් වූ ගිනි ගොඩක් කැලෑවට ඇවිලී සම්පූර්ණයෙන් විනාශ වී ගල් පර්වතය මතු වූ බවට පැවසේ. යමෙකුට කඳවුරු බැඳීමට වඩා සුදුසු වන්නේ මෙම පස් වන කොටුගල පර්වතයයි. අඩි 4597ක් පමණ උස එහි කූඩාරම් ඇටවීමේදී තද සුළඟින් ගසා ගෙන යාම වලක්වාලීම සඳහා උපක්‍රම භාවිතා කල යුතුය. කෙසේ වෙතත් ගිනි මැල සඳහා දර සොයා ගැනීම එතරම් පහසු කටයුත්තක් නොවේ. ජලය නොමැත. මෙහි ඇති ගසකට නැග ගතහොත් කිලෝමීටර් 9ක් දුරින් පිහිටි ශ්‍රී පාද කන්ද හොඳින් දැක ගත හැක. කඳු පංතියේ අවසන් කඳු මුදුන් දෙක මදක් ඇතුලට වන්නට වෙන් වශයෙන් පිහිටා ඇති අයුරු නිරීක්ෂණය කල හැකි විය. මෙම කඳු මුදුන මතද කුඩා බුදු පිළිමයක් තැම්පත් කර ඇත. කොටුගල මත සිට දල ප්‍රපාතය නැරඹිය හැකි ස්ථාන දෙකක් ඇති අතර එය අලංකාර එහෙත් භයංකාර දසුන් මවන ස්ථානයකි. ප්‍රපාතයේ මහරත් මල් කිහිපයක්ද පිපි ඇති අයුරු අපට දක්නට ලැබුණි. ප්‍රපාතය අඩියේ ඝන කැලෑවක් විය. ඊට ඉදිරියෙන් තේ වතු, කොත්තැල්ලෙන

www.Lakviskam.org

ගම්මානය, ඝන වනාන්තරය, ලක්ෂපාන දිය ඇල්ලේ ඉහල කොටස හා අප පසුකර ආ කඳු මුදුන් ආදිය මැනවින් දැකිය හැකි විය. අප හා මෙම ගමනට එකතු නොවී පෙර කඳු මුදුනේ නතර වූ ලසිත හා සංජය සිටින, අප රාත්‍රිය ගත කල ස්ථානය හදුනා ගැනීමටද හැකි විය. ඔවුන් විදුලි පන්දමක් දල්වා ඔවුන් සිටි ස්ථානය අපට පෙන්වන ලදී. සය වන කඳු මුදුන අඩිය පරීක්ෂා කරද්දී ගැඹුරු ගල් දෙබොක්කාවක තිබූ  අලියකුගේ වසුරු පිඩකටද සමාන දෙයක් අප නෙත ගැටුණි.




අප පසු කර ආ සප්තකන්‍යාවියන්ගේ මුදුනත් — අපගේ කණ්ඩායම

කන්දේ අලි ගැවසෙන බවට සාක්ෂි ඇති බවටත්  වෙනත් ස්ථානයක ජල පහරක් අසල අලියකු මිය ගොස් ඇති අයුරු තමා දැක ඇති බවට උපුල් පවසන ලදී. ඉතිරි කඳු වලට දුෂ්කර ගමනක නියැලුණු අප තිදෙනා ආපසු හැරුනේ පහලට යාමට වෙලාව මදි වේවි යන සැකයෙනි. කඳවුරු බිමේ අප සගයින් සකස් කර තිබූ ආහාර අනුභව කර කඳවුරු බිම හොඳින් අස් කර, ගිනි අළු සම්පූර්ණයෙන්ම නිවා ඉවත්කර ආපසු බැසීම ආරම්භ කළෙමු. ආපසු බැසීම එතරම්ම අපහසු නොවූ අතර  පහලට ලිස්සා නොයමින් කෙටි අඩි තබමින් දෙඅත් නිදහස්ව තබා ගනිමින් ඉතා කල්පනාකාරීව කල යුත්තක් විය. ගල් ගැලවී යන ස්ථානයන්හි එකිනෙකා අතර විශාල පරතරයක් තබා ගනිමින් ප්‍රවේශමෙන් හා කල්පනාවෙන් පහලට බැසිය යුතු විය. අතරමග බිම දමා ගොස් තිබූ ප්ලාස්ටික් බෝතල් කිහිපයක් ගමන් මළු වල දමා ගත්තේ වනාන්තරය කෙරෙහි ඇති ආදරය නිසාය. ප.ව. 2.45 පමණ වනවිට පහලට බැසගත් අප පා ගමනින් කොත්තැල්ලෙන කඩමංඩියට ගියේ මීළඟ බසය අල්ලා ගැනීමයි. දහවල් ආහාරයට බත් පැකට් නොතිබුණෙන් බේකරි අහාර වලින් කුස ගිනි නිවාගෙන අප මගපෙන්වන්නා හට ගාස්තුවක්ද ගෙවා ඔහුට සමු දුන්නෙමු. ලක්ෂපාන දිය ඇල්ල බැලීමට යාමට කැමැත්තක් තිබුනත් බසය කොයි වෙලේ පැමිනේදෝ යන සැකය නිසා එය යටපත් කර ගත්තෙමු. සවස 4ට හඟරාපිටිය බසයෙන් ආපසු යාමට පිටත් වූ අපට මගදී අහස අඳුරු වී තද වර්ෂාවක් පතිත වන්නට විය. අපගේ වාසනාවකට මෙන් කැලයේදී වර්ෂාව ආරම්භ නොවීම පිළිබඳව සමන් දෙවියන් හට සිතින් පින් දුන්නෙමු. මුදිතගේ නිවසට වැස්සේම ගිය අපට දහවල් ආහාරයට බත් සූදානම් කර තිබුණි. හිතේ හැටියට නා පිරිසිදු වී බත් කා බඩු ආදිය මාගේ මෝටර් රථයේ දමාගෙන අප සතර දෙනාම කොළඹ බලා පිටත් වුනෙමු. ඇඟ පත වේදනා ගෙන දෙද්දී වාහනය ධාවනය කිරීම මා හට තවත් වෙහෙසකර ක්‍රියාවක් විය. සවස ආරම්භ වූ වර්ෂාව ඉතා දැඩි වූ අතර අඳුරේ පාර පවා පැහැදිලිව දර්ශනය නොවෙන අවස්ථාවක සප්ත කන්‍යාවට සමු දී  අප කොළඹ බලා ආවේ නුදුරේම එම ප්‍රදේශයේම තවත් සංචාරයක යෙදීමේ අරමුණින්.

**අතිරේක යොමු**

අප සංචාරයේ තවත් ඡායාරූප එකතුවක් පහත යොමුවෙන් නරඹන්න.
https://picasaweb.google.com/102500057347588371605/SapthakanyaMountainRangeClimb2016?authuser=0&feat=directlink

www.Lakviskam.org

මෙම සංචාරයේ HD වීඩියෝව අපගේ යූ ටියුබ් (YouTube) චැනලයෙන් නරඹන්න.
https://youtu.be/1LVxOiU2Ri0

අප ගමන් කල අඩි පාරේ GPS සටහන (kml) පහත යොමුවෙන් ලබා ගන්න.
http://www.lakviskam.org/resources.html

සප්තකන්‍යා සම්බන්ධ අද්භූත කතා මෙම දිගු වලට පිවිස කියවන්න
http://www.divaina.com/2015/01/11/feature05.html

---

මෙම වාර්තාවේ අයිතිය “විස්කම් ලක්”වෙබ් අඩවිය සතුය. ©www.lakviskam.org (2016 මාර්තු 29)
විමසීම්සහ අදහස් : lakviskam@gmail.com

www.LakViskam.org